**රාජ්‍ය භාෂා කොමිෂන් සභාව 2013**

**-----------------------------------**

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1991 අංක 18 දරන රාජ්‍ය භාෂා කොමිෂන් සභා පනතේ 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු

කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම්වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිසමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණය ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිසමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

බැංකු ගාස්තු රු.43,443 ක් හා වෙනත් වියදම් රු.6,000 ක් ගිණුම් ගත කර නොතිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 757(ආ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 5.4.10 වගන්තිය | එකතු වටිනාකම රු.1,852,437 ක් වන සැපයීම් 6 ක් සම්බන්ධයෙන් පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) 5.4.4(1) වගන්තිය | පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂනයක් මත සියයට 20 ක උපරිමයක් අත්තිකාරම් ලෙස ගෙවිය හැකි වුවත්, රු.644,375 ක් වූ මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් එනම් රු.322,000 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) 2011 සැප්තැම්බර් 15 දිනැති අංක 58(2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගීත්ව දීමනාවෙන් සියයට 10 ක රඳවා ගැනීමේ බදු අඩු කර ප්‍රේෂණය කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වලින් පසු රු.3,131,575 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,707,830 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.1,576,255 කින් අඩුවීමට පුනරාවර්තන ප්‍රදාන රු.5,550,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර ඇති ක්‍රියාකාරී සැලැස්මට අනුව විද්‍යුත් මාධ්‍ය භාවිතා කරමින් භාෂා අයිතිවාසිකම් සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම සඳහා රු.3,200,000 ක් වැය කර වැඩසටහන් 24 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද රු.114,000 ක් වැය කර එක් වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි.

**4.2 නිශ්ක්‍රිය ඌණ උපයෝජිත වත්කම්.**

සභාවට අයත් වාහනයක් වර්ෂයට අධික කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබූ නමුත් එම රථය අළුත්වැඩියා කොට ධාවනයට ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් හෝ විගණනයක් සිදු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන පිළිබඳ දුර්වලතා වරින්වර කොමිසමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) මිලදී ගැනීම්

(ආ) ස්ථාවර වත්කම් පාලනය